# 2022 පෙබරවාරි මස 17 වන දින පැවති සෞඛ්‍යය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාව

**සහභාගිත්වය**

| | | | |
|---|---|---|---|
| 1. | සුසිල් තිලකරත්න මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති |
| 2. | එම්.පි.එම්.අන්සාර් මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 3. | ඩබ්.එම්.සුපිනි සඳමාලි මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 4. | සුරංගී ආර් සමරතුංග මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 5. | වෛද්‍ය ආර්.එම්.ඩබ්.ඩී.රත්නායක මහතා | - | නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි |
| 6. | ජයනී රාජකරුනා මිය | - | නාගරික ගණකාධිකාරි |
| 7. | කේ.ජී.එන්.සී.බණ්ඩාර මහතා | - | නාගරික ඉංජිනේරු |
| 8. | එන්.පි.කේ.රණසිංහ මිය | - | පරිපාලන නිලධාරි |
| 9. | පද්මා සෙනෙවිරත්න මිය | - | සැළසුම් අංශ ප්‍රධානි |
| 10. | ජේ.බි.මධුෂා ගයත්‍රී මෙනවිය | - | විෂය ලිපිකරු |

**නොපැමිණීම**

| | | | |
|---|---|---|---|
| 1. | ආර්.ඒ.විමල් රවින්ද්‍ර රණසිංහ මැතිතුමා | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |
| 2. | එච්.බි.සිතා හේරත් මැතිතුමිය | - | ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික |

1. අනුරාධපුර,පුල්ලයාර හන්දිය,මිහින්තලා පාර,ලීෂා බී පිෂ් මාර්කට්,ජී.එච්.ජනක මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් පුල්ලයාර හන්දිය මිහින්තලා පාරේ පවත්වා ගෙන යනු ලබන මුහුදු මාළු ලැල්ල නීත්‍යානුකූල කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   ප්‍රසම්පාදන ක්‍රමවේදය මගින් පමණක් මාළු ලැලි ලබා දෙන බැවින් මෙම ඉල්ලීම ඉටුකිරිමට නොහැකි බව තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

2. අනුරාධපුර,ඇලයාපත්තුව,3 කණුව,කේ.ජයසිරි මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් නව බස් නැවතුම්පල අසල මිරිදිය මාළු ලැල්ල මහා නගර සභාවට අදාල ගෙවීම් කර ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   ප්‍රසම්පාදන ක්‍රමවේදය මගින් පමණක් මාළු ලැලි ලබා දෙන බැවින් මෙම ඉල්ලීම ඉටුකිරිමට නොහැකි බව තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

3. අනුරාධපුර,යාපනය හන්දිය,යාපනය පාර,අංක:185,ආර්.එම්.පැතුම් සංජීව මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් මිරිදිය මාළු ලැල්ලක් පවත්වා ගෙන යාම සඳහා 319 තුලානේ පරණ මිහින්තලා පාර,ගඟබඩ මාවත අසල ස්ථානයකයක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
ප්‍රසම්පාදන ක්‍රමවේදය මගින් පමණක් මාළු ලැලි ලබා දෙන බැවින් මෙම ඉල්ලීම ඉටුකිරිමට නොහැකි බව තීරණය විය. (වගකිම - නාගරික ගණකාධිකාරි)

4. අනුරාධපුර,ජයන්ති මාවත,අංක:519/10-3,එම්.ජේ.ෆසිල් මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් කුම්බිච්චන්කුලම සිට මල්වතු ඔය දක්වා ගලා යන කුණු ඇල මගින් ජයන්ති මාවත කඩ තිහ අවට ප්‍රදේශවාසි ජනතාවට දැඩි දුෂ්කරතා පැමිණ ඇත. මදුරු උවදුර, දුර්ගන්ධය, අපිරිසිදුතාවය හේතුවෙන් අවට ජනතාවට ලෙඩ රෝග වැළදීමේ දැඩි ප්‍රවනතාවයක් ඇති බැවින් මෙම කාණු පද්ධතිය කොන්ක්‍රීට් කර පිළිසකර කර දෙන ලෙස ජයන්ති මාවත ප්‍රදේශවාසින් කර ඇති ඉල්ලීම.
මෙම ඉල්ලීම පිළිබඳව අධික්ෂණය කර වාර්තාවක් ලබා ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

5. අනුරාධපුර, බණ්ඩාරනායක මාවත, නිවාස සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කළමනාකරු ජේ.ඒ.ඒ.ප්‍රසන්න මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් සියපත මහල් නිවාස ව්‍යාපෘතියේ බැහැර කරනු ලබන අපවිත්‍ර ජලය සැළසුම් කර ඇති පරිදි ව්‍යාපෘති භූමියේ ඉදිකරනු ලබන ජල පවිත්‍ර කරනු ලබන පද්ධති තුල පිරිසිදු කිරිමෙන් අනතුරුව කුම්බිච්චන්කුලම වැව දක්වා නල මාර්ගයෙන් බැහැර කිරිමට අනුමැතිය ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
මෙම ඉල්ලීම පිළිබඳව පරික්ෂා කර වාර්තාවක් ලබා ගැනිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

6. අනුරාධපුර,යාපනය හන්දිය,අංක:314,ඩබ්.ඒ.අනෝමා චාන්දනි මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් තම නිවස හා කඩ කාමරය ඉදිරිපස ත්‍රීරෝද රථ නැවතුම්පලක් පවත්වා ගෙන යන බැවින්, එම ත්‍රීරෝද රථ කඩ කාමර අවහිර වනසේ සිටින අතර නිතර මත්ද්‍රව්‍ය භාවිතයෙන් අඩදබර සහ අසභ්‍ය වචන භාවිතය නිසා මහත් අපහසුතාවයට පත්වන බව සඳහන් කර ඇත. එබැවින් ත්‍රීරෝද රථ නැවතුම්පල මෙම ස්ථානයෙන් ඉවත් කර දෙන ලෙස කර ඇති ඉල්ලීම.
මෙම කාරණය සම්බන්ධයෙන් අනවසර වාර්තාවක් ලබා ගෙන තිරණයක් ගැනිමට තිරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

7. උතුරු මැද පළාත් වාණිජ කර්මාන්ත හා කෘෂිකර්ම මණ්ඩලය,අධ්‍යක්ෂක ජනරාල් පි.බි.දිසානායක මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් අනුරාධපුර නගරයට විධිමත් රථ වාහන සැළැස්මක් නොමැතිවිම පිළිබඳ ගරු ඉඩම් අමාත්‍යතුමා වෙත යොමු කරන ලද ලිපියේ පිටපතක් කමිටුව වෙත යොමු කිරිම.

මෙම කාරණය සඳහා නාගරික කොමසාරිස්තුමා සමග සාකච්ජා කර විශේෂ කමිටුවක් කැඳවීමට තිරණය විය.

8. සුසාන භූමි පාලක විසින් ලිපියක් ඉදිරිපත් කරමින් නිසල නිම්නය පොදු සුසාන භූමියේ ආදාහනාගාරය වටා ඇති උද්‍යානය දැඩි ලෙස බාදනයවි පස සෝදා ගොස් ඇති බැවින් එම උද්‍යානයේ ඉදිරිපිට ජල බස්නා කාණුව නිසි පරිදි සකසා උද්‍යානය ක්‍රමවත්ව අලංකරණය කර දෙන ලෙස කර ඇති ඉල්ලිම.

මෙම කාර්ය අධික්ෂණය කර වාර්තාවක් ලබා ගෙන කඩිනමින් ඉටු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

9. ගරු නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් පහත සඳහන් ගැටළු සඳහා විසදුම් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

   1. අංක 03 හේනවත්ත කොට්ඨාශයේ පුල්ලයාර හන්දිය ඉදිරිපිට ඇති (කඩ මණ්ඩිය ඉදිරිපිට) කාණු පද්ධතිය සුද්ධ පවිත්‍ර කර ගැනිම,
   2. සඳුන් මාවත පුල්ලයාර හන්දිය ජයනි බයිට් නිවස ඉදිරිපිට පිහිටා ඇති ගෙවත්ත විශාල වශයෙන් වල් බිහිවි අවට නිවැසියන්ට පිඩාකාරි තත්වයක් ඇති බැවින් ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්,
   3. මාතලේ හන්දිය විරසේකර මාවතේ පිහිටි ඩි.එස්.අයි ආයතනයට අයත් ඉඩම වල් බිහිව ප්‍රදේශවාසින්ට විශාල පීඩාවක් ගෙන දෙමින් පවතින බැවින් ඒ සඳහා නීතිමය පියවර ගෙන අදාල ආයතනය වෙත දැනුම් දෙන ලෙසත් කල යෝජන.

මෙම ඉල්ලීම් පිළිබඳ අධික්ෂණය කර වාර්තාවක් ලබා ගෙන ඉටු කිරිමට කීරණය විය.

10. අනුරාධපුර,තිසා වැව,සාරවති ආරාමයේ මෙහෙණින් වහන්සේලා විසින් ලිපියක් යොමු කරමින් සාරවති ආරාමයට යාබදව පිහිටි තලගල සිරි සුගත යෝගාශ්‍රමය නමින් හැදින්වෙන භූමිය අඩි 04 ක් පමණ උසට පස් දමා පුරවා තාප්ප බැද ජලය බැසීමට තිබූ කාණු පද්ධතිය වසා දමා ඇත. වර්ෂා කාලයේදී සාරවති ආරාමයේ සියළු ගොඩනැගිලි ජලයෙන් යටවෙන බැවින් පරික්ෂා කර බලා සහනයක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.

මෙම ඉල්ලීම ඉටු කර ඇති බව නාගරික ඉංජිනේරුතුමා දැනුම් දෙන ලදි.

11. අනුරාධපුර,එස්.ඕ.එස්.ළමා ගම්මානය,ගම්මාන අධ්‍යක්ෂ,එච්.එම්.අතුල කමල්සිරි මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින්,

I. එස්.ඕ.එස්.යොවුන් නිවසට යාබදව ඇති මහල් නිවාස භූමියෙහි මේ වන විට විවිධ නාඳුනන පුද්ගලයින්ගේ අපචාරාත්මක කටයුතු (මත්ද්‍රව්‍ය භාවිතය,අසභ්‍ය වීඩියෝ දර්ශන දරුවන්ට පෙන්වීම,විවිධ ගැටුම් ඇති කර ගැනීම් වැනි) සිදුවන ස්ථානයක් බවට පත්ව ඇත. මේ පිළිබඳ සොයා බලා එම ප්‍රදේශය සුද්ධ පවිත්‍ර කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා ලෙස කර ඇති ඉල්ලීම.

නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාගේ අධීක්ෂණය මගින් කඩිනමින් සුද්ධ පවිත්‍ර කිරීමට තීරණය විය.

II. එස්.ඕ.එස්.ළමා ගම්මානය මගින් ක්‍රියාත්මක වන පෙර පාසල ඉදිරිපිට ප්‍රදේශයේ වැසි වතුර රැඳීම නිසා මදුරුවන් බෝවීම හේතුවෙන් පෙර පාසලේ දරුවන් මෙන් ළමා ගම්මානයේ දරුවන්ද දැඩි අපහසුතාවයකට පත්ව ඇත. පෙර පාසල පරිශ්‍රය ඉදිරිපිට කාණු පද්ධතිය හැකි ඉක්මනින් පිරිසිදු කර දෙන මෙන් කර ඇති ඉල්ලීම.

නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමාගේ අධීක්ෂණය මගින් කඩිනමින් සුද්ධ පවිත්‍ර කිරීමට තීරණය විය.

12. ගරු නාගරික මන්ත්‍රී නලින් සිරිවර්ධන මැතිතුමා විසින් නගරය තුල මගී ජනතාවගේ පහසුව සඳහා කුළී ත්‍රීරෝද රථවල මීටර් සවිකිරීම සුදුසු බවට කල යෝජනාව.

මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත මෙම යෝජනාව යොමු කිරීමට තීරණය කරන ලදි.

13. 2022 වර්ෂයේ සෞඛ්‍ය,පරිසර,කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුවේ වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම කමිටුවට ඉදිරිපත් කල අතර කමිටුව විසින් අනුමත කරන ලදි. (ඇමුණුම 01)

14. නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් කුම්බිච්චන්කුලම වැව සුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක් පැවැත්වීමටත්, දැනට සවිකර ඇති බංකු සෙවන නොමැති ස්ථානවල සවිකර තිබෙන බැවින් සෙවන ඇති ස්ථානවල සවිකිරීමට සුදුසු බව කල යෝජනාව.

මාර්තු මස ශ්‍රමාදාන කටයුතු සිදු කිරීමටත්, එම ස්ථානයේ තිබෙන ගස් අසල කොටු ගල් බංකු සවිකිරීමට තීරණය විය.

15. කමිටු සභාපති ගරු නාගරික මන්ත්‍රී සුසිල් තිලකරත්න මැතිතුමා විසින් උදය මාවත සසෙස් පෞද්ගලික අධ්‍යාපන ආයතනය අසල අඟල් 06 ක බෝක්කුවක් යොදා ඇති නිසා ජලය නොබසින බැවින් ජලය බැසයාමට හැකි පරිදි සකස් කරන ලෙස කල ඉල්ලීම.
මෙම ස්ථානය පරික්ෂා කර බලා සකස් කිරිමට තීරණය විය.

16. කොට්ඨාශ 14 තුල ආකල්ප වර්ධන වැඩසටහනක් පැවැත්විමට කල යෝජනාව අප්‍රේල් මස පැවැත්විමට තීරණය විය. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

**<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>**

- කොට්ඨාශ 14 තුල කසළ බඳුන් බෙදාදීමට තීරණයක් ලබා ගත් අතර, අදාල ප්‍රතිපාදන මගින් නිසි ක්‍රමවේදයන් අනුව කසළ බඳුන් ලබා ගැනිමෙන් අනතුරු එකී කටයුතු කිරිමට තීරණයක් ලබා ගැනිමට යොමු කිරිම.

**<u>වෙනත්</u>**

- ශ්‍රමදාන කටයුතු සිදු නොවු කොට්ඨාශ තුල ශ්‍රමදාන කටයුතු සිදුකිරිමට තිරණය කරන ලදි.

සුසිල් තිලකරත්න,

නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,

සෞඛ්‍යය, පරිසර, කෘෂිකර්ම හා රථවාහන පිළිබඳ ස්ථාවර කමිටුව,

මහා නගර සභාව,

අනුරාධපුර.